# සමාජ - මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණය ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රමාණය, ලිංගික ප්‍රමුඛතා තීරණය සහ පවුල් සැලසුම් පිළිබඳ විමසුමක්

— අභය බණ්ඩාරනායක

මෙම ලිපිය ශ්‍රී ලංකාවේ පවුල් පිළිබඳ ව ලබාගත් දත්ත ආශ්‍රයෙන් ගොඩනැඟුණකි. 1980 දී පවුල් ප්‍රමාණය සහ දරුවන් පිළිබඳ ව ශ්‍රී ලංකා දෙමව්පියන් දරන ආකල්ප සමීක්ෂයකට ලක් කිරීමේ දී මේ නිගමනය කරා එළැඹීමට හැකි වූ බව ප්‍රකාශ කළ යුතු ය. කොළඹ දිස්ත්‍රික්කයේ සහ රත්නපුර දිස්ත්‍රික්කයේ නගර සහ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රයෙන් ලබා ගත් තොරතුරු මෙම ලිපියෙන් ඉදිරිපත් කරනු ලැබේ. මේ සඳහා මූලික වශයෙන් න්‍යායාත්මක කරුණු මුලින් සඳහන් කරනු ලබන අතර, පසු ව අදාළ ක්ෂේත්‍රය හා සම්බන්ධ සමාජ සමීක්ෂණ පිළිබඳ තොරතුරු සඳහන් කරනු ඇත.

## 1.1. ආකල්ප පිළිබඳ න්‍යායාත්මක පසුබිම

ආකල්ප යනු කවරේ ද යන්න විවිධ ව නිර්වචනය වී ඇත. සම්ප්‍රදායානුකූල ව ඉදිරිපත් වී ඇති ආකල්ප අතර සුළු සුළු වෙනස්කම් පවතී. ජී. ඩබ්. ඕල්පෝට් (1935) නමැති මනෝවිද්‍යාඥයා මෙසේ ආකල්ප නිර්වචනය කරයි: ''ආකල්ප යනු වස්තුවකට හෝ අවස්ථාවකට සම්බන්ධ ව පුද්ගලයා දක්වන ප්‍රතිචාර කිසියම් දිසාවකට යොමුකර හෝ ගතික බලපෑම් කරමින් අත්දැකීම් මත සංවිධානය වූ මානසික සහ ස්නායු තත්ත්ව මත පිළියෙළ වූමකි.'' මෙම නිර්වචනයෙන් පුද්ගලයා ගේ චර්යාත්මක නම්‍යතා ඉදිරිපත් කර ඇත.

මෙයට ප්‍රතිපාක්ෂික ඩූබ් (1947) නැමැති මනෝවිද්‍යාඥයා ආකල්ප නිර්වචනය කෙළේ ''සමාජයක පුද්ගලයා දක්වන ප්‍රේරණ නිපැයෙන ප්‍රතිචාර'' වශයෙනි. ඔහු අවධානය යොමු කෙළේ ආකල්ප යනු මොනවා ද යන්න දැක්වීමට මිස ඉන් වන ගම්‍යතා දැක්වීමට නො වේ. ඔහු ගේ ප්‍රකාශන මගින් පුද්ගලයා ගේ බාහිර චර්යාව පිළිබඳ ව නොකියවුණ ද ආකල්ප පුද්ගල ක්‍රියා සඳහා බලපාන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව කරුණු දක්වා ඇත. මෙම නිර්වචනය බිහි වූයේ ඉගෙනුම හෙවත් උත්තේජන—ප්‍රතිචාර සම්ප්‍රදය ප්‍රධාන කොට ගෙන ය. ආකල්ප දැක්වූයේ තවත් සරල ප්‍රතිචාර වශයෙනි.

තෙ වැනි නිර්වචනය බෙහෙවින් පොදුවේ පිළිගැනෙන ඉහත දක්වූ නිර්වචනය දෙකෙහි එන කරුණු ඇතුළත් වූවකි. මෙම නිර්වචනයෙන් ආකල්ප හා සම්බන්ධ ප්‍රධාන අංශ තුනක් වෙත අවධානය යොමු කරනු ලැබීය. මෙම පද්ධති තුන ආශ්‍රයෙන් ආකල්ප බිහි වේ. එම ප්‍රධාන සංකල්ප තුන වූයේ

| | |
|---|---|
| ප්‍රජනනාත්මක කොටස් | **(Cognitive component)** |
| ආවේදනාත්මක කොටස් | **(Affective component)** |
| චර්යාත්මක කොටස් | **(Behavioural component)** |

මෙහි මුල් කොටසින් දක්වෙන්නේ කිසියම් වස්තුවක් හෝ සිදුවීමක් පිළිබඳ ව පවතින ආකල්පයට අයත් විශ්වාස ආදියයි. ආවේදනාත්මක කොටස් නම් එම ආකල්ප විශ්වාසය තුළ පවතින චිත්තවේග හැඟීම් ආදියයි. චර්යාත්මක වන්නේ කිසියම් ක්‍රියාවක් නොහොත් වස්තුවක් පිළිබඳ ව කටයුතු කිරීමේ නැඹියාව හෙවත් බාහිර ක්‍රියා කලාපය වේ. දරුවන් පිළිබඳ ව දෙමව්පියන් දක්වන ආකල්ප යනු ඔවුන් (දෙමව්පියන්) මහලු වියට පත් වූ විට ද දරුවන් ඔවුන්ට දක්වන කැමැත්ත, සුහද භාවය සහ උනන්දුව යනාදියයි. ඉහත දක්වූ අවසාන නිර්වචනය අද බොහෝ සමාජ විද්‍යාඥයන් ගේ සිත් ගත්තකි.

ඉහත සඳහන් තෙවදෑරුම් කොටස්වලින් සංයුක්ත වූ අදහස ආකල්ප වශයෙන් පිළිගැනේ. මෙම සංයුතිය හා ඇසුරු දැනුම්—හැඟීම් මත කිසියම් චර්යාවකට පුද්ගලයා යොමු වේ. එම චර්යාව පුද්ගලයා යම් කිසිවක් පිළිබඳ ව දක් වූ ආකල්පය වශයෙන් විද්‍යමාන වන්නට වෙයි.

මෙම අදහස් හා ආකල්ප ඇසුරින් යම් චරියා සමුදයක් අගය කළ හැකි වේ. ආකල්ප යනු කවර ද යන්න මෙයට වඩා විස්තර කළ යුතු යැයි නො සිතමු. මන්ද? ඉහත කී නිර්වචනයෙන් ආකල්ප යනු කුමක් දැයි මනා ව දක්වෙන බැවිනි. සමාජය තුළ සිටින පුද්ගලයා පවුල් ප්‍රමාණය, ලිංගික ප්‍රමුඛතා සහ පවුල් සැලසුම් පිළිබඳ ව දරන අවබෝධය මත ඔවුන් දක්වන ආකල්පය විමසිය හැකි වේ.

දැනුම, ආකල්පය සහ ප්‍රායෝගිකත්වය **(KAP)** පිළිබඳ අධ්‍යයනය ඇසුරින් දක්වී ඇත්තේ ඔවුනට සත්‍ය වශයෙන් අවශ්‍ය දරුවන් සංඛ්‍යාව සහ සත්‍ය වශයෙන් සිටින දරුවන් සංඛ්‍යාව පිළිබඳ ව ඔවුන් කෙරෙහි පවතින සංජානනවල දැඩි විෂමතා ඇති බව ය. අන් ආසියාතික රටවල් බොහොමයක් ම කර ඇති සමීක්ෂණවලින් අනාවරණය වී ඇත්තේ මෙම ප්‍රතිඵලවලට සමාන තොරතුරු ය. මෙම අධ්‍යයනයෙන් පෙනී ගියේ බලාපොරොත්තු දරුවන් සංඛ්‍යාව සිටින දරුවන් සංඛ්‍යාවට වඩා අඩු බව ය.

මේ පිළිබඳ විවිධ අර්ථ නිරූපණ පවතී. මෙයට හේතු වශයෙන් බොහෝ අය දකින්නේ අප ගේ සමාජයේ වැඩි දෙනකු කෙරෙහි පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ පුළුල් අවබෝධයක් නැති බව ය. මෙම හේතුව යම් තරමකට සත්‍යය වුවත්, මෙයට සම්බන්ධ සාධක (විචල්‍ය ) ද ඇති බව පෙනෙයි. නියමිත (ideal) දරුවන් සංඛ්‍යාව සත්‍ය වශයෙන් ඉන්නා (actual) සංඛ්‍යාවට වඩා වැඩි-අඩු වීමට හේතු වන එය කෙරෙහි බලපාන විචල්‍ය පිළිබඳ ව ප්‍රමාණවත් කරුණු විමසීමක් ඉටු වී නැති බව පෙනේ. නියමිත දරුවන් සංඛ්‍යාව සත්‍ය වශයෙන් ඉන්නා සංඛ්‍යාවට වඩා අඩුවීමට හේතු කිහිපයක් ම දක්වා ඇත. පවුල් සැලසුම් ක්‍රම ඇසුරින් පවුල් සීමා කර ගැනීමට අපහසු වීම නිසා සමහර

සම්ප්‍රදායානුකූල පවුල් තමනට පිරිමි දරුවන් යම් සංඛ්‍යාවක් සිටිය යුතු යැයි සිතති. ආසියාවේ සාම්ප්‍රදායික පවුල් මෙන් ම ශ්‍රී ලංකා ග්‍රාමීය පවුල් ද තමන් වෙත පිරිමි දරුවන් සිටීම ඉතා අවශ්‍ය ලෙස කල්පනා කරති. පවුලේ නම ඉදිරියට ගෙන යන්නේ පිරිමියා ය. ආර්ථික වශයෙන් ද ඔහු කෙරෙහි අගයක් රැඳෙයි. එසේ ම, ස්වාමි පුරුෂයා ගේ සංකේතය වන්නේ ද ඔහු ය.

ඉන්දියාවේ කර ඇති අධ්‍යයනයක් (වයන් සහ ගෝර්ඩන්, 1970) මගින් දක්වෙන්නේ යම් පවුලකට ඇත්තේ දූ පමණක් නම්, ඒ අය තවත් දරුවන් බිහිකර ගැනීමට පෙළඹෙන බවයි. එසේ ම යම් පවුලක සිටින්නේ පුතුන් වැඩි ප්‍රමාණයක් නම් තවත් දරුවන් ඇතිකර ගැනීමේ චේතනාව ඔවුන් කෙරෙහි අඩු ය. චීනය, ජපානය, කොරියාව වැනි රටවල විශ්වාස අනුව වැඩි කැමැත්ත ඇත්තේ පුතුන්ට යි (කැස්ට්‍රා 1972).

නියමිත (ideal) දරුවන් සංඛ්‍යාවට වඩා සත්‍ය වශයෙන් ම ඇති දරුවන් ගණන අඩු වීම පිළිබඳ ව දිය හැකි තවත් හේතුවක් නම්, ලිංගික ප්‍රශ්න අප සමාජය තුළ තහංචියක් ලෙස තව ම සැලකීමයි. මෙය විශේෂයෙන් ම කාන්තා පක්ෂය හා සම්බන්ධ ය. මේ නිසා පවුල් පිළිබඳ ව — විශේෂයෙන් ලිංගික කටයුතු හා සම්බන්ධ ව, ඔව්හු සාකච්ඡාවක් නො කරති.

තම පවුල්වලට අවශ්‍ය නියමිත දරු සංඛ්‍යාව සහ ඇත්ත වශයෙන් සිටින සංඛ්‍යාව රඳා පවතිනුයේ ඒ ඒ පවුල්වල සාමාජිකයන් සමාජය ආශ්‍රයෙන් දක්වන අගයන් ද සංවර්ධන අවධිය ද මත ය. සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවල ඉහත සඳහන් හේතු සහ අගයන් මෙවැනි තත්ත්ව අභිමි වීමට බලපාන බව පෙනේ. යම් රටක් නවීකරණය වීමත් ජීවන තත්ත්ව ඉහළට යාමත් සමග ම එවැනි ආබාධ හීන වී යයි.

ශ්‍රී ලංකාවේ නාගරික පවුල්වල නියමිත දරුවන් සංඛ්‍යාව 2·8 පමණ වේ. එසේ ම ග්‍රාමීය පවුල් ප්‍රමාණය 3·8 වේ. මුළු ලංකාව ම සමස්තයක් වශයෙන් ගත් කල, ලද නියදිය අනුව, පවුල් ප්‍රමාණය 3 බව පෙනී ගොස් ඇත. දරුවන් දෙදෙනකු පමණක් සිටීමට එතරම් කැමැත්තක් ශ්‍රී ලංකා සමාජය නොදක්වන බව පෙනේ. එක දරුවකු මිය ගිය හොත් ඉතුරු වන්නේ එක දරුවෙක් පමණි. එක් දරු පවුල දරුවාට මෙන් ම දෙමව්පියන්ට ද සෑහෙන අඩුපාඩු ඇති කරයි. එසේම ස්ත්‍රී පුරුෂ දෙවර්ගයේ ම දරුවන් සිටින පවුල් ශ්‍රී ලංකාවේ වැඩි අගයෙන් සලකනු ලබති. මෙම කරුණු සෑම සාමාජික ආර්ථික කාණ්ඩයක් විසින් ම දැඩි අවධානයට යොමු කරනු ලැබ ඇත.

## 1.2. පවුල් ප්‍රමාණය සහ ලිංගික ප්‍රමුඛතාව

ළමා වර්ධනය පිළිබඳ සමීක්ෂණවල දී දරුවන් ප්‍රමාණය පිළිබඳ ව කරුණු එතරම් වැදගත් විචල්‍යයක් ලෙස සලකා නැත. යම් දරුවකුට තමා සමග ජීවත්වන තවත් දරුවන් ගෙන් වන බලපෑම කුමක් ද, එසේම ලිංගිකත්වය සහ වයස අනුව ඒ දරුවාට වන බලපෑම් කවරේ ද ළමයින් සිටින ප්‍රමාණය කවරේ ද? යන කරුණු මත මෙය විමසුමට යොමු වේ. මේ හා සම්බන්ධ අධ්‍යයනය කර ඇත්තේ ඉතා ස්වල්ප වශයෙනි.

තොම්සන් (1970), ක්ලෝසන් සහ ක්ලෝසන් (1973) පවුල් ප්‍රමාණයේ බලපෑම විශේෂයෙන් ළමයින්ට සහ දෙමව්පියන්ට අදාළ කරුණු, මෙම අධ්‍යයනය මගින් විමසුමකට ලක්කර ඇත. මෙම විමසුම් දෙකෙන් ම අවධානයට යොමු වූයේ මේ පිළිබඳ තව දුරටත් අධ්‍යයන කළ යුතු ව ඇති බව යි. ළමයින් සංඛ්‍යාව අඩු පවුල්වල ළමයින් වැඩි-

හිටියන් සමඟ ඇති කර ගන්නා අන්තර් ක්‍රියා නිසා ඔවුන් තුළ වාචික හැකියා ඉතා දියුණුව පැවතුණ බව පෙනී ගොස් ඇත. විශේෂයෙන් කුඩා පවුල්වල බුද්ධි ඵලය ද වැඩි බව පෙනී යන කරුණකි. සමාජ සැකැස්ම පිළිබඳ ව කුඩා පවුල්වල බලපෑම එතරම් පැහැදිලි වී නැත. ඒ වුව ද කුඩා පවුල් සෑම අතින් ම හොඳ බව සනාථ වන කරුණු රැසක් ම ඉදිරිපත් වී ඇත. මෙම කරුණ පිළිබඳ ව විස්තර අර්ථවත් කිරීමේ දී පවතින ප්‍රධාන අපහසුතා අතර ළමයින් හද වඩාගන්නා දෙමව්පියන් ජීවත්වන සමාජ වටපිටාව මත කුඩා හෝ විශාල පවුල් කෙරෙහි දක්වන නැමියාව ප්‍රධාන වේ. පවුල් ප්‍රමාණය පිළිබඳව මනෝවිද්‍යාත්මක අධ්‍යයනය කර ඇත්තේ ඇමරිකාව සහ යුරෝපීය රටවල් ය. ඒ අනුව, ඒ ඒ රටවල සමාජ රටාව, පවුල් ව්‍යුහ, ළමයින් ඇති දැඩි කරන පිළිවෙත් යනාදිය මත ළමයින් පිළිබඳ ඔවුන් දක්වන බලපෑම් අතර වෙනස්කම් පැවතිය හැකි බව පෙනෙයි.

ලීබර්මන් (1970) පවුල් ප්‍රමාණය පිළිබඳ සැහෙන විවරණයක්, මනෝචිකිත්සක දෘෂ්ටිකෝණය ආශ්‍රයෙන්,කර ඇත. ළමයින් ගේ ශාරීරික සහ මානසික වර්ධනයක් පමණක් නොව, මව ගේ සෞඛ්‍ය තත්ත්වය සහ පවුලේ ශුභසාධනය ද පිළිබඳ කරුණු එහි පවතී. මෙම ලිපි පෙළින් හෙළිදරව් වන නිගමන අතර වඩා කිට්ටු කාල තුළ ඉප දී ඇති දරුවන් සිටීම නුසුදුසු බව ද, වැඩි ළමයින් සිටීම එතරම් සතුටුදයක තත්ත්වයක් නොවන බව ද සඳහන් කර ඇත.

ඉහතින් පෙන්වා දුන් පරිදි, සිටිය යුතු දරුවන් සංඛ්‍යාව පිළිබඳ ව තීරණය වනුයේ ඒ ඒ සමාජ විසින් දරුවන් කෙරෙහි දක්වන අගය සහ කැමැත්ත (value), දෙමව්පියන් ගේ වයස සහ ඔවුන් විවාහ ව ගත කර ඇති අවුරුදු සංඛ්‍යාව යන සාධක මත බව පෙනී ගොස් ඇත. ශ්‍රී ලංකාවේ නියදි ආශ්‍රයෙන් ගම්බද සහ නගරබද විවාහක පවුල් දරුවන් පිළිබඳ ව දක්වන කැමැත්ත හා සිටිය යුතු සේ පිළිගන්නා දරුවන් සංඛ්‍යාව පිළිබඳ සැහෙන කරුණු අනාවරණය වී ඇත. එසේ ම විවිධ සමාජ ආර්ථික තත්ත්ව ඇති කණ්ඩායම් අතර මේ වෙනස දැකගත හැකි විය. විශේෂයෙන් ගම්බද පවුල්, නාගරික දෙමව්පියන්ට වෙනස් ව, තම දරුවන් ආර්ථික සම්පතක් ලෙස සැලකූහ. එමෙන් ම නාගරික දෙමව්පියෝ පවුලේ එකඟතාව සඳහා වැදගත් කොටසක් ලෙස දරුවන් සැලකූ අතර, කුඩා පවුල් කෙරෙහි විශේෂ කැමැත්තක් දක්වති. අප කළ සමීක්ෂණ අනුව අනාවරණය වූයේ නාගරික පවුල් අවශ්‍ය ළමයින් ප්‍රමාණය 2.4 ලෙස සැලකූ අතර, ගම්බද දෙමව්පියන් එම සංඛ්‍යාව 4 ලෙස සලකා ඇත. ඔවුනට අවශ්‍ය ළමයින් සංඛ්‍යාව පිළිබඳ ව කරන ලද විමසුමේ දී හෙළිදරවු වූයේ විවිධ ආර්ථික සමාජ තත්ත්වවල සිටින අය විවිධ මත දරන බවයි. මෙයට හේතු වශයෙන් පෙනී ගියේ නාගරික සහ ගම්බද සමාජය තුළ සිදුවේගෙන යන සමාජ වෙනස සැහෙන ප්‍රධාන සාධකයක් වී ඇති බවය. මෙම සමීක්ෂණයේ දී ප්‍රතිචාර දැක්වූවන් වැඩි දෙනා දරුවන් සඳහා වැඩි කැමැත්තක් දැක්වූ අතර, 31% පමණ දෙනා තමන්ට දරුවන් සිටීම ගැන කැමති නො වූහ. බිරින්දෑලා (ස්වාමි පුරුෂයන්ට වෙනස් ව) දැනට සිටින දරුවන් සංඛ්‍යාවට වඩා වැඩි දරුවන් සංඛ්‍යාවක් අපේක්ෂා කරන බව ද පෙනේ.

පවුල්වලට අවශ්‍ය (wanted) දරුවන් සංඛ්‍යාව සිටිය යුතු (ideal) සංඛ්‍යාවට වඩා අඩු බව පෙනිණි. නගරබද පවුල් අවශ්‍ය ළමයින් සංඛ්‍යාව ලෙස 3.3 යනුවෙන් දක්වා ඇති, අතර ග්‍රාමීය පවුල් එය 4.1 ක් ලෙස සලකා ඇත. කාන්තා පක්ෂය සහ පුරුෂ පක්ෂය අතර සැහෙන වෙනස්කම් ද පෙනුණි. ළමයින් හද වඩා ගැනීමේ පිළිවෙළ ද දරුවන් කෙරෙහි ඔවුන් දක්වන අගයන් ද මෙම වෙනස කෙරෙහි බලපා ඇත. තම තමන්ට සිටිය යුතු සේ දක්වන දරුවන් ප්‍රමාණය අනුව, ඔවුන් විවිධ සමාජ-ආර්ථික

කාංඩවලට අයත් බව දක්වන අතර ඔවුන් දරන සමාජ සහ ආර්ථික තත්ත්වය නිසා සිය දරුවන් සංඛ්‍යාව සීමා කර දනට සිටින සංඛ්‍යාව වුවමනා ප්‍රමාණය ලෙස ගෙන ඇත. ග්‍රාමීය ප්‍රතිචාරකයන් නාගරික ප්‍රතිචාරකයන්ට වඩා නියමිත දරුවන් සංඛ්‍යාව පිළිබඳ ව අදහස් ප්‍රකාශ කර ඇත. මෙහි දී විශේෂයෙන් සලකනු ලැබුවේ පවුලේ නම ගෙනයාම සඳහා පිරිමි ළමයින් අවශ්‍ය බව සහ දරුවන් ආර්ථික සම්පතක් බව යන සාධක ය. සාඵල්‍යතා අභිප්‍රේරණය ඒ ඒ සමාජ හා ජීවන තත්ත්ව හේතු කොට ගෙන යටපත් වී ඇති බව පැහැදිලි වූවකි. විශාල පවුල් සඳහා ඒ ඒ පවුල්—සමාජ කාංඩායම් තුළ කැමැත්තක් පැවතුණත්, ඇකැමැත්තෙන් වුව තම පවුල් ප්‍රමාණය සීමා කර ගැනීමට පෙළඹී ඇත්තේ ජීවන තත්ත්වය නිසා ය. මෙම කරුණ වඩාත් යෝග්‍ය වනුයේ නාගරික පවුල් කෙරෙහි සමාජ තුළ ඇතිවෙමින් පවත්නා වෙනස්කම් නිසා ළමයින් කෙරෙහි නාගරික ප්‍රතිචාරයෙන් දක්වන අගයන් ගම්බද අයට වඩා වෙනස් වූ අතර ම, එ නිසා ම නාගරිකයන් කුඩා පවුල් සඳහා වැඩි කැමැත්තක් දක්වූයේ ඒ සමාජ ක්ෂේත්‍ර තුළ ඇති වන්නාවූ ක්ෂණික වෙනස්කම් නිසා ය.

සාමාන්‍ය

පළමු සටහන

පවුල් ප්‍රමාණය

| මිණුම් | නාගරික | ග්‍රාමීය | පුරුෂ | ස්ත්‍රී | සියලු |
|---|---|---|---|---|---|
| සිටින ළමයි සංඛ්‍යාව | 2.8 | 4.0 | 3.4 | 3.4 | 3.4 |
| අවශ්‍ය ළමයි සංඛ්‍යාව | 3.3 | 4.1 | 3.6 | 3.8 | 3.7 |
| කැමති ළමයි සංඛ්‍යාව | 2.9 | 4.4 | 3.7 | 3.8 | 3.8 |
| නියමිත ළමයි සංඛ්‍යාව | 2.8 | 3.8 | 3.3 | 3.4 | 3.3 |
| නියමිත සහ අවශ්‍ය ළමයින් අතර වෙනස | 0.5 | 0.3 | 0.3 | 0.4 | 0.4 |
| සිටින ළමයින් සහ අවශ්‍ය ළමයින් අතර වෙනස | 0.5 | 0.1 | 0.2 | 0.4 | 0.3 |

සංඛ්‍යානාත්මක විග්‍රහයට අනුව පෙනී ගියේ ජීවතුන් අතර සිටින ළමයින් හා අවශ්‍ය ළමයින් සංඛ්‍යාව පිළිබඳ ව ඒ ඒ ප්‍රතිචාරක අතර දැඩි විෂමතාවක් පැවතෙන බවයි. එම කරුණු නාගරික සහ ස්ත්‍රීන් අතර පැහැදිලි ව පෙනී යයි.

ලිංගික ප්‍රමුඛතාව, එනම් තමන්ට අවශ්‍ය වනුයේ පුත්‍රයෙක් ද නැත හොත් දුවක් ද යන බව ද, මෙම අධ්‍යයනයේ දී අවධානයට ලක් කර ඇත. විශේෂයෙන් ග්‍රාමීය සහ පිරිමි කාංඩායම් පිරිමි දරුවන්ට ප්‍රමුඛත්වය දෙති. එහෙත් නාගරික ප්‍රතිචාරකයෝ පිරිමි—ගැහැණු නො සලකා සමාන ව දරුවන් බලාපොරොත්තු වෙති. නාගරික දෙමව්පියෝ

දරුවන් තම පවුලේ ප්‍රීතිය සඳහා සිටිය යුතු යැයි ද අදහස දරති. දරුවන් අවශ්‍ය වූයේ වෙනත් කිසිදු හේතුවක් නිසා නොවන බව නාගරික දෙමව්පියන් ගේ ප්‍රතිචාරවලින් පෙනිණි. සාම්ප්‍රදයික ග්‍රාමීය සමාජ මත දරු ග්‍රාමීය ප්‍රතිචාරකයන් පුතුන් කෙරෙහි විශේෂ කැමැත්තක් දක්වූයේ ඔවුන් තම පරම්පරාවේ නම ගෙනයන්නන්, එනම් තමන් ගේ ඉදිරි පරපුර මෙහෙයවන්නන් නිසා ය. පුතුන් ගෙන් පවුලේ සුභසාධනය සහ සමෘධිය ග්‍රාමීය දෙමව්පියන් බලාපොරොත්තු වන බව ද පෙනෙයි. (දෙ වැනි සටහන බලනු). සමාජ ආර්ථික සමූහවලින් 42% පමණ සංඛ්‍යාවක් වඩා පුතුන්ට කැමති වන අතර, සියයට 48 පමණ ග්‍රාමීය ප්‍රතිචාරකයෝ පුතුන් ප්‍රිය කරති. 48% ක් පමණ පිරිමි පුතුන්ට කැමති ය. එහෙත් නාගරික ප්‍රතිචාරකයන් ග්‍රාමීය ප්‍රතිචාරකයන් සේ පුතුන් ම තමන්ට අවශ්‍ය බව ප්‍රකාශ කිරීමට මැළි වී ඇත. ඒ හා සමාන ව ම දූන් ද ඔවුන් ප්‍රිය කර ඇත.

දෙ වැනි සටහන

ලිංගික ප්‍රමුඛතාව (ප්‍රතිචාරකයන් ගේ සියයට ප්‍රමාණය)

| ප්‍රමුඛතාව | නාගරික | ග්‍රාමීය | පිරිමි | ස්ත්‍රී | සියලු |
|---|---|---|---|---|---|
| දූන් | 30 | 13 | 17 | 25 | 21 |
| පුතුන් | 35 | 48 | 48 | 36 | 42 |
| විශේෂත්වයක් නැත | 34 | 37 | 34 | 38 | 36 |

මෙම ප්‍රමුඛතාවලින් හෙළි වනුයේ ඒ ඒ අය ළමයින් සඳහා දක්වන අගය සහ විශ්වාසය වේ. ළමයින් කෙරෙහි රඳා පැවතීම තමනට ඇති විශේෂ වාසියක් ලෙස මව්පියෝ කල්පනා කරති. විශේෂයෙන් ශ්‍රී ලංකා සමාජ පසුබිම මත මෙය වඩාත් තහවුරු වෙයි. පුද්ගලයා ගේ ආවේගාත්මක පදනම සහ චරියාත්මක ආකල්ප මත දරුවන් පිළිබඳ අගයන් දක්වී ඇති බව පෙනේ.

පවුලේ ප්‍රමාණය පවා ගොඩනැඟී ඇත්තේ ආකල්ප පදනම් කොට ගෙන යි. දෙමව්පියන් කෙරෙහි පැවතුණු ආකල්ප සහ අගයවල සමානත්වය සහ අගැයුම් පද්ධති මත මෙවැනි ආකල්ප සහ අගයවල් දක්වුණු බව පෙනේ. සමාජ මිණුම්දඬු ආශ්‍රයෙන් මෙවැනි අගයවල් පිළිබිඹු වූ බව කිව යුතු ය. ඕනෑ ම සමාජයක චරියා රටා ගොඩ නැගෙනුයේ මෙවැනි මිණුම් දඬු පදනම් කොට ගෙන ය. නාගරික සමාජය විශාල පවුල් කෙරෙහි විශේෂ කැමැත්තක් නොදක් වූ අතර, ග්‍රාමීය සමාජ ප්‍රතිචාරකයන් සිය පවුලේ ප්‍රමාණය පිළිබඳ ව නිශ්චිත ස්වරූපයක් නොදක්වූවා සේ ම, ඔවුන් දරුවන් වැඩි වැඩියෙන් ඇතිකර ගැනීමට අකමැති නො වූ බව පෙනී යන කරුණකි.

## 1.3 තීරණ ගැනීම සහ පවුල් සැලසුම් කිරීම

සාඵල්‍යතා චර්යාව පිළිබඳ ව තීරණ ගැනීමේ ක්‍රියාවලිය එතරම් පැහැදිලි ව තේරුම් ගත් බවක් නොපෙනේ. බොහෝ පවුල් සැලසුම් වැඩ සටහන්වල වඩාත් වැදගත් පුද්ගලයා ලෙස සැලකුණේ භාර්යාව ය. ඒ අනුව පවුල් සැලසුම් ක්‍රම පිළිගන්නා පුද්ගලයා ඇය ලෙස සලකා ඇය කෙරෙහි මූලික අවධානය යොමු කරන ලදි. කෙසේ වුව ද බිරින්දෑත් ස්වාමියාත් අතර ඇති අදහස් හුවමාරු කර ගැනීමේ පිළිවෙත පිළිබඳ ව කල්පනා කිරීමේ දී මේ සම්බන්ධ කරුණු නැවතත් අගැයුමක් කිරීමට අවශ්‍ය බව පෙනී ගොස් ඇත.

කොරියාවේ ස්වාමියා පවුල් සැලසුම් ක්‍රියාවලියේ දී දක්වන චරියා පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක් කළ කිම් සහ ලී (1973) අනාවරණය කෙළේ තම ස්වාමිපුරුෂයා මෙ වැනි සැලසුම් කිරීමක් පිළිගනී යැයි බිරින්ද කෙරෙහි අවබෝධයක් ඇති වුව හොත්, එසේ ම පවුල් සැලසුම පිළිබඳ ව යහපත් ආකල්පයක් තිබුණ හොත්, එම අන්තර්-සබඳතාව මත එවැනි පවුල් සැලසුමක් පිළිගැනීමට ඇය කැමති වන බවයි. තව ද එම අධ්‍යයනයෙන් ම හෙළිදරවු වූයේ එවැනි පවුල් සැලසුමක් සඳහා ස්වාමි පුරුෂයා ගේ පූර්ණ සහයෝගය දක්වන කල බිරින්ද කැමැත්තක් නොදක්වතත් පවුල් සැලසුම් පිළිගැනීමට ඔවුන් පෙළඹෙන බවත්, බිරින්ද කැමැත්ත ප්‍රකාශ කරන අතර ස්වාමිපුරුෂයා සහයෝගයක් නො දක්වුව හොත්, ඒ සඳහා පෙළඹීම ඉතා අල්ප වන බවත් ය.

මේ සම්බන්ධ ව විවිධ රටවල කර ඇති අධ්‍යයනවලින් මේ හා සමාන ප්‍රතිඵල ලැබී ඇත. ස්වාමිපුරුෂයා ගේ අධිකාරිත්වය පවතින පවුල් ව්‍යූහ ඇති සමාජවල මෙ වැනි ස්වභාවයක් පැවතීම පුදුමයක් නොවන බව කිව යුතුයි. හේතුව, සම්ප්‍රදායානුකූල ව ස්වාමියා පවුලේ ප්‍රධානයා වීම ය. මුලින් සඳහන් කළ පරිදි, දරුවන් සඳහා ඇති කැමැත්ත හුදු ආර්ථික හේතු මත පමණක් ඇති නො වේ. සමාජ-මනෝවිද්‍යාත්මක කරුණු ද ඒ හා අදළ ය. පිරිමියා ගේ අධිකාරිය, පෞරුෂත්වය සහ ඔහු සතු වරප්‍රසාද යන සාධක ඉතා වැදගති.

මෙම කරුණු සනාථ වන දැනුම, ආකල්ප සහ ප්‍රායෝගිකතාව (KAP) පිළිබඳ ආසියානු රටවල කර ඇති විවිධ අධ්‍යයනවලින් හෙළිදරවු වන්නේ පුරුෂයා ගේ වර-ප්‍රසාද සැලකූ අවස්ථා මත කැරුණු පවුල් සැලසුම් අගැයීම සහ ඒවාට කැමැත්ත දැක්වීම භාර්යාවන් ඒ අවස්ථාව පිළිබඳ ව දක්වන ලද කැමැත්තට වඩා අඩු ප්‍රමාණයෙන් යුක්ත බව යි. උදහරණයක් වශයෙන් පිලිපීනයේ කරන ලද අධ්‍යයනයකින් හෙළි වූයේ කාන්තා-වන් (85%) පුරුෂයන්ට වඩා (63%) පවුල් සැලසුම් අනුමත කර ඇති බවය. පුරුෂයන් තුනෙන් කොටසක් 'සංඛ්‍යාවක් පිළිබඳ ව අදහසක් නැත' යන පිළිතුර දී ඇත (ෆ්රැන්-සිස්කෝ 1970). එහෙත් ඉන්දුනීසියාවේ පුරුෂයන්, කාන්තාවන්ට වැඩි සංඛ්‍යාවකින්, දරුවන් අවශ්‍ය බව ප්‍රකාශ කර ඇත (ඉන්දුනීසියානු සැලසුම් ගත දෙමව්පියන් ගේ සංගමය 1968).

ෆ්රෙන්වෝටර් (1965) සඳහන් කරන පරිදි බොහෝ ආසියානු රටවල විවාහක යුවතීන් තම තමන් ගේ ක්‍රියා පටිපාටි වෙන් වෙන් ව පවත්වාගෙන යාමේ සබඳතාවක් පෙන්නුම් කර ඇත. ස්වාමියා ඉටු කළ යුතු ක්‍රියාදමය මේවා ය භාර්යාව ඉටු කළ යුතු ක්‍රියා මේවා ය. යනුවෙන් පිළිගෙන, ඒ අනුව තමතමනට හිමි කොටස් ඉටු කිරීම එහි සමාජ චර්යාව යි. හුවමාරු කොට ගෙන කටයුතු කිරීම ආසියාවේ සමාජ ව්‍යූහය තුළ නොපැවතුණ ලක්ෂණයකි. ඒ අනුව, ළමයින් ඇති කර ගැනීමේ තීරණය සතු වූයේ පුරුෂයා වෙත යි. එනම්, පවුලේ ආර්ථිකය සහ ශුභසාධනය ස්වාමියා සතු වගකීමක් විය. එසේ ම එය ඔහු ගේ චර්යා රටාව ද වි ය.

කැනිලා (1970) විසින් ද මෙම කරුණ පිළිබඳ ව වෙනත් විචල්‍ය හා සම්බන්ධ ව, එනම්, බිරින්ද හා ස්වාමියා අතර අදහස් හුවමාරුව මත-යම් යම් කරුණු හඳුනාගෙන ඇත. එනම්, සම්ප්‍රදායානුකූලත්වය, ස්ත්‍රී පුරුෂ දෙදෙනා සතු කාර්ය සහ අධිකාරිභාවය යන විචල්‍ය තුන මේ සම්බන්ධයෙන් අවධාරණය කොට ඇත. සම්ප්‍රදායානුකූල ව ස්වාමියා—බිරින්ද අතර අධිකාරි බව පුරුෂයා දරන්නා සේ ම, ස්ත්‍රී—පුරුෂ පොදු කාර්ය අතර

පුරුෂයා ස්ත්‍රිය අභිබවා සිටී. මේ හැම අවස්ථාවක් ම සියලු තීරණ කෙරෙහි බලපායි. වෙනත් වචනයෙන් කිව හොත්, තීරණ ගැනීමේ දී පුරුෂයා තමා ගේ අභිමතය බොහෝ දුරට ක්‍රියාත්මක කරලීම මෙම සමාජ ව්‍යුහය මත දැකිය හැකි අතිවිශේෂ ලක්ෂණයකි (මිචෙල් 1972).

මෑතක දී හොංකොං නගරයේ කර ඇති අධ්‍යයනයකින් අනාවරණය වූයේ ස්වාමියා-බිරින්දෑ අතර සබඳතාව යහපත් ව පවතින්නා වූ ද, පවුල් සැලසුමත් තම අනාගතයත් පිළිබඳ ව නිතර කථා කරන්නා වූ ද පවුල්වල භාර්යාවන් ගේ ළමයින් සංඛ්‍යාව එසේ නොවන භාර්යාවන් ගේ ළමයින් සංඛ්‍යාවට අඩු බවයි. එසේ ම පවුල්වල අධිකාරිය බලවත් ලෙස භාර්යාවන් සතු වන්නා සේ ම, නිතර ස්වාමියා සමග එක් ව තීරණය ගන්නා පවුල්වලට සිටියේ ළමයින් සුළු ප්‍රමාණයකි.

මෙම අධ්‍යයනයේ දී (බණ්ඩාරනායක 1980) ප්‍රතිචාරකයන් ගෙන් තීරණ ගැනීම සහ පවුල් සැලසුම් කිරීම පිළිබඳ තොරතුරු විමසනු ලැබී ය. පවුල් සැලසුම් කිරීම පිළිබඳ කරුණු ද, පවුලේ කටයුතුවලට වැදගත් වන සමාජ ආර්ථික කරුණු ද අවධානයට යොමු කරනු ලැබී ය. මෙම අධ්‍යයනයේ දී නියදිය ලෙස ගත් ප්‍රතිචාරකයන් අතර ස්වාමියා සහ බිරින්දෑ යන දෙදෙනා ම එකතු ව බොහෝ විට දී තීරණ ගෙන ඇති බව හෙළි විය. මේ අතර පවුල් සැලසුම් ක්‍රම භාවිතය ගත හොත්, නගරබද ප්‍රතිචාරකයන් 82% ක් ද, ග්‍රාමීය ප්‍රතිචාරකයන් 68 ක් ද පැවසුවේ මේ දෙදෙනා ම සහයෝගයෙන් මේ පිළිබඳ තීරණ ගන්නා බව ය. එසේ ම, ඔවුන්ට අවශ්‍ය ළමයින් සංඛ්‍යාව පිළිබඳ තීරණ ගැනීමේ දී නගරබද අය 87% ක් ද, ග්‍රාමීය අය 75% ක් ද දෙ දෙනා ගේ ම තීරණ මේ සඳහා බලපාන බව ප්‍රකාශ කළහ. වෙනත් තීරණ - උදාහරණ වශයෙන් ස්වාමියාට-බිරින්දෑට සුදුසු රැකියාව පිළිබඳ තීරණ, නිවසක් ගොඩනැගීම, මිළ දී ගැනීම, බඩු මිල දී ගැනීම වැනි කටයුතුවල දී දෙ දෙනා ම එකතු ව තීරණවලට එළඹෙන බව පෙනී ගොස් ඇත. මෙම අධ්‍යයනයෙන් ලත් ප්‍රතිඵල බොහෝ විට දී කිම් සහ ලී (1973) කළ අධ්‍යයනයේ ප්‍රතිඵල ද මිචෙල් විසින් (1972) කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵල ද සමග එකඟ වන බව ද ඒවා අන්‍යෝන්‍ය ව තහවුරු වන බව ද පෙනේ. එලෙස සමගි තීරණ මත කුඩා පවුල් ගොඩනැගේ ය යන අදහස මෙම වත්මන් අධ්‍යයනයේ නගරබද ප්‍රතිචාරකයන් ආශ්‍රිත ව සැබෑ වූ බව පෙනේ. ඔවුන් ගේ සමාජ තත්ත්වය කෙසේ වුව ද (නාගරික—ග්‍රාමීය) මෙම ප්‍රතිචාරකයන් (ස්වාමියා—බිරින්දෑ) නොමඳ ව අදහස් හුවමාරු කර ගනිමින් තීරණ කරා එළඹුණු බව පැහැදිලි ය (සටහන් 3 බලන්න). ශ්‍රී ලංකා සමාජ ව්‍යුහය දෙස බලන විට දී සිංහල බෞද්ධ පවුල්වල සාමාන්‍යයෙන් ස්වාමියා පවුලේ ප්‍රධානයා ලෙස සලකනු ලැබුවත්, නොමඳ ව අදහස් හුවමාරු කර ගැනීමේ සිරිතක් ඔවුන් අතරේ තිබුණු බව පැහැදිලි ය. ස්වාමියා සහ බිරින්දෑ අතර සමානත්වයක් ඇතැයි ඉහත කී කරුණු මත ගම්‍ය වුවත්, ශ්‍රී ලංකා පවුල් සෑම විට දී ම තම පවුලේ ආර්ථික සහ සමාජ ශුභසාධනය පතා අදහස් විමසීමේ සහ හුවමාරු කරගැනීමේ ලා උත්සාහ ගෙන ඇති බව කිව යුතු ය. ශ්‍රී ලංකා පවුල්වලට ළමයි අවශ්‍ය වන්නේ ඇයි ද යන ප්‍රශ්නය පිළිබඳ ව සැලකිලිමත් වන්නකුට හෙළිදරව් වන්නේ විවිධ අගයන් මත අදාළ තීරණ රැඳී පවතින බව ය.

පවුල් සැලසුම් ක්‍රම භාවිතය සහ ඒ පිළිබඳ දැනුම සම්බන්ධ තොරතුරුවලින් අනාවරණය වූයේ නාගරිකයන් 81% ක් ද ග්‍රාමිකයන් 75% ක් ද එම අවබෝධයෙන් යුක්ත වුණු බව යි. එසේ එම ක්‍රම භාවිතය කෙරෙහි නාගරිකයන් 83% ක් ද, ග්‍රාමිකයන් 63% ක් ද එකඟ බව පෙනේ. මෙම තොරතුරුවලින් හෙළි වූයේ සෑම ප්‍රතිචාරකයකු ම පවුල් සැලසුම් ක්‍රම කෙරෙහි කැමැත්ත දැරූ බව යි (තෙ වැනි සටහන බලන්න). ශ්‍රී ලංකාවේ

පවුල් සැලසුම් පිළිබඳ ව ස්ටයින්බෝර්ග් (1975) අධ්‍යයනයෙන් ලත් ප්‍රතිඵල අප ගේ අධ්‍යයනයේ ප්‍රතිඵල සනාථ කරයි. දෙමව්පියන් වෙත මෙම ක්‍රම භාවිතය පිළිබඳ හොඳ දැනුමක් තිබුණ ද සමහර සමාජ-මනෝවිද්‍යාත්මක සාධක නිසා ඒවා පිළිගැනීමෙහි ලා ගැටළු පැන නැගී ඇත. මෙවැනි බාධා මත ස්වාමිපුරුෂයන් දැඩි එකඟතාවක් සහ සහයෝගයක් දැක්වුව ද ඔවුන් ගේ ආකල්ප පවුල් සැලසුම් පිළිබඳ ව එතරම් සතුටුදායක නො වී ඇත.

### 6 වැනි සටහන

තීරණ ගැනීම (ප්‍රතිචාරකයන් ගේ සියයට ප්‍රමාණය)

| තීරණ ස්වභාව | තීරණගන්නා | නාගරික | ග්‍රාමීය | ස්වාමියා | බිරින්දෑ |
|---|---|---|---|---|---|
| නිවසකට අයත් බඩු මිල දී ගැනීම | බිරින්දෑ පමණක් | 02 | 03 | 01 | 03 |
| | බිරින්දෑ-ස්වාමියා | 90 | 80 | 79 | 91 |
| | ස්වාමියා පමණක් | 06 | 15 | 18 | 03 |
| | නො දනී | 01 | — | — | — |
| බිරින්දෑ ස්වාමියා සඳහා රැකියා | බිරින්දෑ පමණක් | 07 | 05 | 02 | 09 |
| | ස්වාමියා පමණක් | 35 | 08 | 04 | 32 |
| | බිරින්දෑ-ස්වාමියා | 45 | 48 | 49 | 45 |
| | නො දනී | 13 | 12 | 13 | 12 |
| පවුල් සැලසුම් ක්‍රම භාවිතය | බිරින්දෑ පමණක් | 02 | — | X | X |
| | ස්වාමියා පමණක් | 03 | 07 | 03 | 06 |
| | බිරින්දෑ-ස්වාමියා | 82 | 68 | 81 | 68 |
| | නො දනී | 12 | 24 | 13 | 23 |
| අවශ්‍ය යැයි සිතන ළමයි සංඛ්‍යාව | බිරින්දෑ පමණක් | 06 | 05 | 02 | 08 |
| | ස්වාමියා පමණක් | 02 | 04 | 05 | X |
| | බිරින්දෑ-ස්වාමියා | 87 | 75 | 81 | 80 |
| නිවසක් මිළ දී ගැනීම | බිරින්දෑ පමණක් | 05 | 01 | 04 | 01 |
| | ස්වාමියා පමණක් | 03 | 16 | 09 | 10 |
| | බිරින්දෑ-ස්වාමියා | 91 | 74 | 78 | 86 |
| | නො දනී | — | 07 | — | X |

X සියයට එකට අඩු

ලෝක සාඵල්‍යතා සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කළ සමහර අර්ථ නිරූපණ ද මෙහි දී වැදගත් වේ. ආසියාවේ පවුල් සැලසුම් ක්‍රම වැඩ සටහන් සාර්ථක වීමට හේතු වී ඇත්තේ එම ක්‍රම-ශිල්ප පිළිබඳ පවතින දැනුම බව සර් මොරිස් කැන්ඩල් විසින් කරන ලද ප්‍රකාශන් වලින් තහවුරු වී ඇත (1970). අනාගත සාඵල්‍යතා කැමැත්ත ප්‍රමුඛත්වය පිළිබඳ ව

දක්වන්නේ සාමාන්‍යයෙන් කාන්තාවන් තවත් අමතර දරුවකුට අකැමැති බව යි. මෙයින් කියැවෙනුයේ පවුල් සැලසුම් ක්‍රම අවශ්‍ය බව ය. එසේ ම, ඉතා පුළුල් ලෙස සාඵල්‍යතා හීනතාවක් මෙම කලාපයේ පවතින බව දැකගත හැකි වී ඇත. විශේෂයෙන් බංගලා දේශය, ෆිජි දිවයින, ඉන්දුනීසියාව, කොරියාව, මැලේසියාව, නේපාලය, පකිස්ථානය, ශ්‍රී ලංකාව, තායිලන්තය වැනි රටවල මිනිසුන් ගේ ආකල්ප දැනුම සහ භාවිතය පිළිබඳ ව කර ඇති සමීක්ෂණවලින් හෙළි වූයේ ඉතා වැදගත් කරුණු බව පෙනේ. එම රටවල මේ දැනුම සහ ඒ ක්‍රම භාවිතය විවිධ මට්ටමින් පවතින බව පෙනෙයි. මෙම විස්තරය ඒ ඒ රටවල දැනුම, භාවිතය සහ ආකල්ප නියෝජනය කරයි. අප ගේ අධ්‍යයනයේ (බණ්ඩාරනායක 1980) ප්‍රතිඵල මේ ලෝක සාඵල්‍යතා සමීක්ෂණයේ (WFS) ප්‍රතිඵල හා සම වනු පෙනේ.

## 1.4 නිගමන

මේ අනුව මෙතෙක් අප ගේ සාකච්ඡාවට භාජනය වූ සමීක්ෂණ ප්‍රතිඵල පහත සඳහන් පරිදි මකුටියෙන් ගෙනහැර දැක්විය හැකි ය. පළමුවෙන් ම ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රමාණය 3.3 සිට 4.1 දක්වා සංඛ්‍යාවකින් යුක්ත විය යුතු බව බලාපොරොත්තු වනු පෙනේ. නියමිත දරුවන් සංඛ්‍යාව අවශ්‍යය දරුවන් සංඛ්‍යාවට වඩා අඩු වී ඇත. මෙය සැම කොට්ඨාශයකට ම පොදු ය. මෙම වෙනස 0.3 වෙයි. මෙම තොරතුරු ස්ටයින්බර්ග්ගේ අධ්‍යයනයේ ප්‍රතිඵල හා සම ය. ඔහු ගේ අධ්‍යයනය අනුව ග්‍රාමීය පවුලේ නියමිත ප්‍රමාණය වූයේ දරුවන් 3.8 කි. මෙම අධ්‍යයනයේ දී ග්‍රාමීය පවුල් ප්‍රමාණය 3.8 වූ අතර නාගරික ප්‍රමාණය 2.8 විය. මෙම අධ්‍යයන දෙකේ ම ප්‍රතිඵල මෙසේ සමතාවක් දැක්වූයේ මෙම සමාජ ආකල්ප, ආර්ථික තත්ත්වය සහ විශේෂ දැනුම යන සාධකවල සම බව නිසා ය.

මෙහි දී අවබෝධ කර ගත යුතු කරුණක් වන්නේ 'නියමිත පවුල් ප්‍රමාණය' යන්නෙන් යමකු ගේ ජීවන තත්ත්වය මත කැමැත්ත දැක්වූ ළමයින් සංඛ්‍යාව අදහස් කරන ලද බවයි. කැමති වූ ළමයි සංඛ්‍යාව යම් පවුලක වර්තමාන ජීවන තත්ත්වය ගම්‍ය කරවයි. නියමිත පවුලේ ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාව අවශ්‍ය පවුල් ප්‍රමාණයට වඩා වැඩි වීමෙන් පැහැදිලි වනුයේ ආර්ථික සහ වෙනත් සාධක නිසා ඒ ආශාව ඔවුන් යටපත් කර ඇති බව යි. එහෙත් මෙම කරුණ නාගරික සහ ග්‍රාමීය පවුල් ප්‍රමාණය පිළිබඳ සැලකීමේ දී ගම්‍ය නොවේ (බලන්න පළමු සටහන). සීමිත දරුවන් ප්‍රමාණය නියමිත යැයි සිතන දරුවන් ප්‍රමාණය ඉක්මවා යයි නම් ඉන් පිළිබිඹු වන්නේ උපයෝගිතාවයි: එනම් දරුවන් ගේ ප්‍රයෝජනය යි. මෙය ග්‍රාමීය පවුල් ඇසුරින් දැකගත හැකි වූවකි. නාගරික පවුල් (ප්‍රතිචාරකයෝ) මෙම වෙනස නො දක්වති. නියමිත සංඛ්‍යාව 2.8 විය. එහෙත් ග්‍රාමීය පවුල් තුළ මෙම වෙනස පැවතුණි. සත්‍ය ප්‍රමාණය 4.0 විය. නියමිත ප්‍රමාණය 3.8 විය. මෙයින් දරුවන් කෙරෙහි ග්‍රාමීය පවුල් තුළ පවතින උපයෝගිතා ආකල්පය පිළිබිඹු වෙයි.

දෙවනු ව, නූතන සමාජ තත්ත්ව හේතු කොට ගෙන නාගරික සහ ග්‍රාමීය ජන කොට්ඨාශ පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ අවබෝධ කර ගෙන සිටින අතර, ඒවා අනුමත කොට භාවිත් කිරීමට කැමැත්තක් දැක්වූ බව පෙනේ.

තෙවනු ව, නියමිත දරුවන් ප්‍රමාණය සඳහා අප ගේ සාංස්කෘතික සාධක විශේෂයෙන් පිරිමි—ගැහැණු උපත් මත පදනම් වුණි. මෙ වැනි අවස්ථාවල දී දෙමව්පියන් තමන් ගේ කැමැත්ත ඉක්මවා යන තත්ත්ව කරා පත් වී ඇත. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සමාජ තත්ත්ව මත පිරිමි දරුවන් කෙරෙහි විශේෂ කැමැත්තක් පෙන්වනු ලැබේ. මෙම මතය මනෝවිද්‍යාත්මක මෙන් ම සමාජ විද්‍යාත්මක අධ්‍යයනවලින් ද තහවුරු කර ඇත. ඔබයසේකර (1967) 'ගම' නිර්වචනය කළේ මුතුන් මිත්තන් ගේ නිජබිම් වශයෙනි. ලීච් (1961) 'වරිගය' පිතෘ-මූලිකත්වය මත රඳවා දක්වයි. තම්බයියා (1985) 'වාසගම' සහ 'ගෙදර' යන නාම විශේෂයෙන් කන්ද උඩරට භාවිත කෙළේ පිරිමි පාර්ශ්වය මුල් කොට ගෙන බව ප්‍රකාශ කරයි. ග්‍රාමීය පරිසරයෙහි පිරිමි දරුවා ආර්ථික තත්ත්වය, කෘෂි කටයුතු සහ ආරක්ෂාව සඳහා අවශ්‍ය වූවකු ලෙස සැලකුණා සේ ම, ඒ නිසා ම ග්‍රාමීය ප්‍රතිචාරකයන් පිරිමි දරුවාට (ගැහැණු දරුවාට වඩා) ප්‍රමුඛස්ථානයක් ද දෙයි.

අවසාන වශයෙන්, මෙම සමාජ ආර්ථික කොටඨාශ දෙකේ ම අය අතර නිරතුරු ව කරනු ලබන අදහස්-හුවමාරුව මත තීරණ ගැනීම සඳහා රඳා පැවතුණ බව පෙනේ. මෙය ශ්‍රී ලංකාවේ සමාජ සාංස්කෘතික රටාවේ දිස්වන්නකි. එනම්, කාන්තාවන් පුරුෂයන් හා නිතර විමසීම් කරමින්, අවශ්‍ය වැදගත් අවස්ථාවල දී ඔවුන් හා ඒකාබද්ධ ව තීරණවලට එළඹෙන බවකි.

**References :**


ALLPORT G. W. (1935) Attitudes in C. Murchison (ed.) Hand-book of Social Psychology. Worcester, Mass. Clark University Press

ABEYKOON A. T. P. L. (1980) Recent Changes in the Population Growth in Sri Lanka, in Performance. January—June. Ministry of Plan Implementation, Colombo

BANDARANAYAKA., A. (1980) A Dimension of Values of Children in Sri Lankan Parents—Socio—Psychological Analysis. U. S. J., Sri Lanka

CASTRO, R. H. CARIDAD, (1972) Superstitious Beliefs and Practice in Some Asian Countries. Implications for Family Planning Communications, Sixth Progress Report UP/IMC, UNESCO - NFPA Family Planning Communication. University of Philippines. November — December

CLAUSEN, J. A. and CLAUSEN, S. (1973) The Effect of Family Size on Parents and Children, in J. T. Fawcett (ed.) Psychological Perspective on Population. Basic Books, New York

DOOB, L. (1947) The Behaviour of Attitude. Psychological Review, 54

FRANCISCO, M. RENALDO, *et al* (1970) A Study of the Knowledge — Attitude Practice of Family Planning. Cebu City, University of Philippines, Institute of Hygiene, May 1968

KENDALL, SIR M. (1979) The World Fertility Survey, Current Status and Findings, Population Report Series, No. 3, Vol. VII No. 4. John University, Baltimore

KIM, CHING, Hee and Sun Oin Lee, (1973) Role of Husband in Family Planning Behaviour, Psychological Studies in Population. Vol. 1, No. 5, May

KUTHIALA, S. K. (1970) The Decision Making Patterns for Family Planning among Husbands and Wives. Some Theoretical Issues. Population Institute of America, Atlantic, Georgia. 16 — 18 April

LEACH, E. R. (1961) Pul - Eliya, A Village in Ceylon, Cambridge University Press

LILBERMAN, E. J. A. (1970) Case for the Small Family in PRB Selection, Washington, D. C. Population Reference Bureau. April, No. 32

MITCHELL, R. E. (1972) Husband and Wife Relations and Family Planning Practices in Urban Hongkong, Journal of Marriage and Family, 34

OBEYSEKERA, G. (1967) Land Tenure in Village Ceylon, Cambridge University Press

RAINWATER, LEE, (1965) Family Design Mental Sexuality, Family Size, and Contraception, Aldine Publishing Co., Chicago

STIERNBORG, M. (1975) Family Planning in Sri Lanka, A Family Life Survey in Two Different Ethnic Areas, Stockholm

TAMBIAH S. J. (1958) The Structure of Kinship and its Relationship to Land Possession and Residence in Pata-Dumbara, Central Ceylon, Journal of Royal Anthropological Institute. Vol. 88.

THANPSON, V. (1970) Does Family Size Make Differences? Grove Conference on Population Planning and National Family Planning Policy, Winston Saleem, North Carolina

WRAY, J. D. (1971) Population Pressure on Families, Family Size and Child Spacing. Report on Population Family Planning, New York Population Council, No. 9

WYON, J. B. and GORDON. J. E. (1971) A Long Term Perspective Type. Field Study of Population Dynamics in Punjab, India in Kiser (ed.) Research in Family Planning